අද

# පාර්ලිමේන්තු හා පළාත් සභා එක් දිනයක තබා කෝටි 200ක මුදල් ඉතිරි කරගන්න - පැෆරල් සංවිධානය

**එච්.අයි. තුෂාර**

පාර්ලිමේන්තු මැතිවරණය හා පළාත් සභා මැතිවරණය එකම දිනයක පැවැත්වීම තුළින් රුපියල් කෝටි දෙසීයක මහජන මුදල් ඉතිරිකර ගත හැකි නිසා මැතිවරණ දෙකම එකම දිනයක පැවැත්විය යුතු බව පැෆරල් සංවිධානය පවසයි.

මැතිවරණ දෙකම එකම දිනයක පවත්වන ලෙසට ඊයේ (30දා) ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගෙන්, අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාගෙන් සහ කථානායක කරු ජයසූරිය මහතාගෙන් ලිඛිතව ඉල්ලා සිටි බවද එම සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා සඳහන් කළේය.

මේ වසරේ දෙසැම්බර් 09 වැනිදාට පෙර ජනාධිපතිවරයෙකු තෝරාපත් කරගත යුතු බවත්, මේ නිසා කල්ගත වෙමින් තිබෙන පළාත් සභා මැතිවරණය කඩිනමින් පැවැත්වීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකළ යුතු බවත් ඒ මහතා පවසා සිටියේය.

ඌව පළාත් සභාව හැර සෙසු පළාත් සභාවල නිල කාලය අවසන් වී තිබෙන බැවින් ඌව පළාත් සභාවේ නිල කාලය ඔක්තෝම්බර් මාසයේදී අවසන් වීමට නියමිත බවත් විධායක අධ්‍යක්ෂවරයා සඳහන් කර සිටියේය.

එබැවින් පළාත් සභා මැතිවරණයක් කඩිනමින් පැවැත්විය යුතු බවත්, මැතිවරණ දෙකම එකම දිනයක පැවැත්වීම තුළින් රුපියල් කෝටි දෙසීයක මුදලක් ඉතිරි කරගත හැකි බවට බලධාරීන් ප්‍රකාශ කරන බවද හෙතෙම පැවසීය.

Scanned with CamScanner